(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **11**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 පෙබරවාරි 24 බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා, සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යතුමා සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** ප්‍රවාහන අමාත්‍යතුමිය

ගරු **විමල් වීරවංශ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෛයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **(මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු **සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

ගරු **ගෝවින්දන් කරුණාකරම් මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **ෆයිසාල් කාසිම් මහතා**

ගරු **ජයන්ත කැටගොඩ මහතා**

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

ගරු **උදයන කිරිඳිගොඩ මහතා**

ගරු **ලලිත් වර්ණ කුමාර මහතා**

ගරු **ගෙවිඳු කුමාරතුංග මහතා**

ගරු **කේ. පී. එස්. කුමාරසිරි මහතා**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **කරුණාදාස කොඩිතුවක්කු මහතා**

ගරු **මනෝ ගනේෂන් මහතා**

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු හරීන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

**ගරු එම්. රාමේෂ්වරන් මහතා**

**ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**

**ගරු ගාමිණී වලේබොඩ මහතා**

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**

**ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**

**ගරු මධුර විතානගේ මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ.ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පදනමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කර එම වාර්තාව, ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ තුර්කි ජනරජයේ ආණ්ඩුව අතර ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මඟහැරීම වැළැක්වීම සඳහා 2022 ජනවාරි 28 දින ඇතිකර ගත් ගිවිසුම පිළිගන්වා එම ගිවිසුම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු සී. බී. රත්නායක මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) (452 අධිකාරය වූ) ගස් හෙලීම (පාලනය කිරීමේ) පනතේ 2 වගන්තිය යටතේ නියමය;

(ii) 2016 වර්ෂය සඳහා මිල්කෝ (පුද්) සමාගමේ වාර්ෂික වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව;

(v) 2015 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(vi) 2018 වර්ෂය සඳහා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව;

(vii) 2018/2019 වර්ෂය සඳහා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව;

(viii) 2017 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(ix) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව;

(x) 2019/2020 වර්ෂය සඳහා සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව;

(xi) 2018 වර්ෂය සඳහා ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(xii) 2019 වර්ෂය සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) නාකුළුගමුව, ගලගම, "විජය නිවස" යන ලිපිනයෙහි පදිංචි ජී. එච්. එම්. ඩී. ඕෂනී අශේලිකා මහත්මියගෙන් ලැබුණු 2021.12.01 දිනැති පෙත්සම;

(ii) නාකුළුගමුව, සීනිමෝදර, ලැබීම, අංක 12/04 දරන ස්ථානයෙහි පදිංචි එල්. ඒ. නිශාන්ත මහතාගෙන් ලැබුණු 2021.10.28 දිනැති පෙත්සම; සහ

(iii) අම්බලන්තොට, විත්‍රාගල, මිණිපුරගම යන ලිපිනයෙහි පදිංචි සමරවික්‍රම ආරච්චිගේ නිමල් මහතාගෙන් ලැබුණු 2021.10.06 දිනැති පෙත්සම

ගරු නාමල් රාජපක්ෂ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මාතලේ, වාරියපොල වත්ත, අංක 23/13 දරන ස්ථානයෙහි පදිංචි ඒ. සුන්දරලිංගම් මහතාගෙන් ලැබුණු 2021.11.05 දිනැති පෙත්සම;

(ii) පලාපත්වල, කෝන්ගහමුල, වික්ටර් පාර්ක්, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි දෙනගමගේ සෝමසිරි මහතාගෙන් ලැබුණු 2021.11.11 දිනැති පෙත්සම;

(iii) මුල්ලේරියාව නව නගරය, කැළණිමුල්ල, අංක 130/බී දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. ඩී. රංජිත් මහතාගෙන් ලැබුණු 2021.10.10 දිනැති පෙත්සම;

(iv) දෙකටන, පැලහැල, අංක 275/1 දරන ස්ථානයෙහි පදිංචි පී. ජී. ඒ. ඒ. බාලසූරිය මහත්මියගෙන් ලැබුණු 2021.09.30 දිනැති පෙත්සම; සහ

(v) නාකුළුගමුව, ගලගම, "සිරි සෙවන" යන ලිපිනයෙහි පදිංචි යූ. ඩබ්ලිව්. ඒ. පියසිරි මහතාගෙන් ලැබුණු 2021.11.24 දිනැති පෙත්සම

ගරු අනුර දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(3) ත්‍රිකුණාමලය, ධාන්‍යගම, අංක 09 දරන ස්ථානයෙහි පදිංචි ටී. ඒ. ජීවාංගනී මහත්මියගෙන් ලැබුණු 2022.01.03 දිනැති පෙත්සම ගරු විජිත හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(4) හිඟුරක්ගොඩ, හිඟුරක්දමන, අක්කර 100 පාර, 5 කණුව යන ලිපිනයෙහි පදිංචි ජේ. ඒ. රම්‍යලතා ජයසිංහ මැණිකේ මහත්මියගෙන් ලැබුණු 2022.01.18 දිනැති පෙත්සම ගරු අමරකීර්ති අතුකෝරළ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) මීරිගම, විජය රජදහන, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි එම්. සුමිත් නාරද මහතාගෙන් ලැබුණු 2021.11.11 දිනැති පෙත්සම ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**රැස්වීම තාවකාලිකව අත්හිටවීම**

පූ.භා.10.58

පූ.භා. 11.10 වන තෙක් රැස්වීම තවකාලිකව අත්හිටවන ලදී.

පූ.භා. 11.10

රැස්වීම යළිත් එක්රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.

**4. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය:** අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2022 පෙබරවාරි 21 දිනැති අංක 2268/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2022.02.23 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

(අ.භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.27 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.17 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1):** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 නොවැම්බර් 30 දිනැති අංක 2256/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.01.20 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2):** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජනවාරි 11 දිනැති අංක 2262/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.02.08 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 3):** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජනවාරි 11 දිනැති අංක 2262/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.02.08 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 4):** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජනවාරි 11 දිනැති අංක 2262/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.02.08 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 5):** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වගන්තිය සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජනවාරි 13 දිනැති අංක 2262/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.02.08 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය:** අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 නොවැම්බර් 15 දිනැති අංක 2254/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.01.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" යි වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

මූලාසනාරූඪ මන්ත්‍රීවරයා මූලාසනාරූඪ විය.

1 වන වගන්තියේ සිට 4 වන වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තෙවැනිවර කියවිය යුතු ය"යි වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තෙවැනිවර කියවා සම්මත කරන ලදී.

**13. ගස් හෙළීම (පාලනය කිරීමේ) පනත යටතේ නියමය:** කෘෂිකර්ම අමාත්‍යවරයා වෙනුවෙන් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— (452 අධිකාරය වූ) ගස් හෙළීම (පාලනය කිරීමේ) පනතේ 2 වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජූනි 18 දිනැති අංක 2232/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.01.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. කල් තැබීම (තෘණ භූමි හිඟයෙන් කිරි ගොවීන් මුහුණ දෙන ගැටලු):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2022 පෙබරවාරි 25 අඟහරුවාදා පූ. භා. 10.00 වනතෙක් කල් ගියේය.